සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

32 | S | I

**7 ශ්‍රේණිය** | **ගණිතය** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- I කොටස සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලැබේ.

01. 5g 450 mg යන්න මිලි ග්‍රෑම්වලින් ලියන්න.

02. "WATTALA" යන වචනයේ අකුරු කුලකය වෙන් රූපයක දක්වන්න.

03. ක්‍රි.ව. 2025 වර්ෂය අයත්වන,
   (i) දශකය ලියන්න.
   (ii) සියවස ලියන්න.

04. 1m 20cm ක් දිග තඹ කම්බියකින් 15cm ක් දිග කම්බි කැබලි කීයක් කපා ගත හැකි ද?

05. $3 \times 3 \times 3 \times a \times a$ යන්න දර්ශක ලෙස ලියන්න.

06. $5(7-3)+1$ සුළු කරන්න.

07. $5x+1=31$ විසඳන්න.

08. මෙම ත්‍රිකෝණය,
   (i) පාද අනුව කුමන වර්ගයට අයත් ද?
   (ii) කෝණ අනුව කුමන වර්ගයට අයත් ද?




09. $\frac{2}{5} + \frac{1}{10}$ සුළු කරන්න.

10. සවිධි බහුඅස්‍රයක ලක්ෂණ දෙකක් ලියන්න.

11. $18, 24, 30$ යන සංඛ්‍යාවල මහා පොදු සාධකය සොයන්න.

12. පහත දැක්වෙන භාග ආරෝහණ පිළිවෙලට ලියන්න.

$\frac{1}{2}$ , $\frac{1}{3}$ , $\frac{3}{5}$

13. වෘත්තයක අරය 8 cm වේ නම්, එහි විෂ්කම්භයේ දිග සොයන්න.

14. $x = 5$ ද $y = 2$ ද වන විට $8y + x$ හි අගය සොයන්න.

15. $5.72 \div 1000$ සුළු කරන්න.

16. දිග 25cm හා පළල 13cm වූ සෘජුකෝණාස්‍රයක වර්ගඵලය සොයන්න.

17. $3x + 6y + 5x + 3y + 7$ සුළු කරන්න.

18. මෙම රූපයේ පරිමිතිය සොයන්න.




19. 0.35 යන්න භාගයක් ලෙස සරල ම ආකාරයට දක්වන්න.

20. පහත දැක්වෙන සංඛ්‍යා අතරින් 6 න් ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යා යටින් ඉරක් අඳින්න.

162, 6039, 543, 7212

- පළමු ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් ද ලැබේ.

---

01. (a) පහත සමූහ අතරින් කුලකයක් වන සමූහ ඉදිරියෙන් '✓'ද, කුලකයක් නොවන සමූහ ඉදිරියෙන් 'X' ද යොදන්න.

(i) ඉංග්‍රීසි හෝඩියේ ස්වර අක්ෂර ( )

(ii) ප්‍රථමක සංඛ්‍යා ( )

(iii) දක්ෂ ගායකයෝ ( )

(iv) උස ළමයි ( )

(v) 0 ත් 20 ත් අතර 4 ගුණාකාර ( )

(b) A = {0 සිට 20 තෙක් ඇති සමචතුරස්‍ර සංඛ්‍යා}

(i) ඉහත දැක්වෙන A කුලකය ලැයිස්තුගත කිරීමක් ලෙස දක්වන්න. (ල.02)

(ii) 49 ඉහත කුලකයේ අවයවයක් වන්නේ ද? හේතු දක්වන්න. (ල.02)

(c) සෘජුකෝණාස්‍රයක දිග එහි පළලට වඩා 3cm කින් වැඩි ය.

(i) සෘජුකෝණාස්‍රයේ දිග $x$ නම්, පළල සඳහා වීජීය ප්‍රකාශනයක් ලියන්න. (ල.01)

(ii) සෘජුකෝණාස්‍රයේ පරිමිතිය සඳහා වීජීය ප්‍රකාශනයක් ගොඩනගන්න. (ල.02)

(iii) සෘජුකෝණාස්‍රයේ පරිමිතිය 26cm නම් සරල සමීකරණයක් ගොඩනගා එහි දිග හා පළල සොයන්න. (ල.04)

---

02. (i) AB = 6cm වන සරල රේඛා ඛණ්ඩයක් ඇඳ එහි මධ්‍ය ලක්ෂ්‍යය O ලෙස නම් කරන්න. (ල.03)

(ii) O කේන්ද්‍රය හා OA අරය වූ වෘත්තය අඳින්න. (ල.02)

(iii) කේන්ද්‍රය B වූ ද අරය, ඉහත වෘත්තයේ අරයට සමාන වූ ද තවත් වෘත්තයක් ඇඳ වෘත්ත දෙක ඡේදනයවන ලක්ෂ්‍ය P හා Q ලෙස නම් කරන්න. (ල.03)

(iv) OPBQ චතුරස්‍රය සම්පූර්ණ කර එම චතුරස්‍රය හඳුන්වන නම ලියන්න. (ල.03)

---

03. පහත දක්වා ඇත්තේ එක්තරා නිවසක ඝනකාභ හැඩැති ජල ටැංකියක පතුලේ දළ රූපයකි.



(i) ටැංකියේ පතුලේ පරිමිතිය සොයන්න (ල.02)

(ii) පතුලේ වර්ගඵලය කොපමණ ද? (ල.02)

(iii) පතුලේ ආරක්ෂාව සඳහා යම් ආලේපයක් ගැල්වීමට අදහස් කරන අතර එහි දී වර්ග මීටරක් සඳහා රුපියල් 250 ක මුදලක් වැය වේ නම් ඒ සඳහා අවශ්‍ය වන මුළු මුදල සොයන්න. (ල.02)

(iv) ඉහත ටැංකියේ උස 4m ක් වේ නම් ටැංකියේ පරිමාව සොයන්න. (ල.03)

(v) ඝන මීටර එකක පරිමාවකට ජලය ලීටර 1000 ක් දැමිය හැකි නම් ටැංකියට දැමිය හැකි මුළු ජල පරිමාව ලීටර වලින් සොයන්න. (ල.02)

---

04. (a) සුළු කරන්න.

(i) $\frac{5}{7} - \frac{4}{7}$ (ල.01)

(ii) $\frac{2}{3} + \frac{1}{4}$ (ල.03)

(iii) $4\frac{3}{5} - 1\frac{1}{5}$ (ල.03)

(b) අගය සොයන්න.

(i) 45.31 x 1000 (ල.02)

(ii) 7.51 x 9 (ල.02)

---

05. (a) (i) මෙම රූපයේ සමමිති අක්ෂ අඳින්න. (ල.02)

(ii) එදිනෙදා ජීවිතයේ දී සමාන්තර රේඛා 2 ක් දක්නට ලැබෙන අවස්ථා දෙකක් ලියන්න. (ල.02)



(b) (i) C මගින් දැක්වෙනුයේ කුමන වර්ගයේ කෝණයක් ද? (ල.01)

(ii) මෙම බහුඅස්‍රය කුමන වර්ගයේ බහුඅස්‍රයක් ද? (ල.01)




(c) (i) $50^0$ ක කෝණයක් ඇඳ එය ABC ලෙස නම් කරන්න. (ල.03)

(ii) ඔරලෝසුවක මිනිත්තු කටුව 1 ඉලක්කමේ සිට 3 ඉලක්කම තෙක් භ්‍රමණය වීමේදී සෑදෙන කෝණය කවර වර්ගයේ කෝණයක් ද? (ල.02)

06. (a) සුළු කරන්න.

(i) (+5) + (-3) (ල.01)

(ii) (-4) + (-2) (ල.01)

(b) (i) 36 ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස ලියන්න. (ල.03)

(ii) $a = 2$ ද $b = 2$ ද විට $4a^2b$ හි අගය සොයන්න. (ල.03)

(c) කොළඹ බස් නැවතුමෙන් මිනිත්තු 30 කට වරක් A නගරයට ද, මිනිත්තු 40 කට වරක් B නගරයට ද, බස් රථ පිටත් වේ. පෙ.ව. 9.00 ට මෙම නගර දෙකට ම එකවර බස් රථ පිටත් වූයේ නම් නැවත එකවර නගර දෙකටම බස් රථ පිටත්වනුයේ කීයට ද? (ල.03)

---

07. (a) 7 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සමුදි, අමායා, නෙත්මි යන යෙහෙළියන් තිදෙනා $1l$ $500ml$ ක බීම බෝතලයක් ගෙන එය සම්පූර්ණයෙන් ම පානය කළෝ ය. එහිදී සමුදි විසින් $420ml$ ක් ද, අමායා විසින් $570ml$ ක් ද, බැගින් පානය කර තිබුණි.

(i) නෙත්මි පානය කළ බීම ප්‍රමාණය සොයන්න. (ල.03)

(ii) සමුදිට වඩා අමායා කොපමණ බීම ප්‍රමාණයක් පානය කර ඇතිදැයි සොයන්න. (ල.01)
එය ලීටර වලින් දක්වන්න. (ල.02)

(b) සුළු කරන්න.

(i)

| | *g* | *mg* |
|---|---|---|
| | 5 | 900 |
| + | 2 | 450 |
| | | |

(ල.02)

(ii) භාග්‍යා පාසලට ඇතුළත් කරන විට ඇගේ වයස අවුරුදු 5 යි මාස 6 යි දින 23 කි. මේ වන විට අවුරුදු 6 යි මාස 7 යි දින 19 ක් ඇය පාසලේ ඉගෙන ගෙන ඇත. දැන් ඇගේ වයස කීය ද? (ල.03)